**ශීර්ෂය 117 - මහාමාර්ග අමාත්‍යාංශය**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

-----------------------------------

මහාමාර්ග අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහාමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහාමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

--------------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මහාමාර්ග අමාත්‍යාංශය යටතේය. ඒ අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූප බව ප්‍රකාශ කළ නොහැක.

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මහාමාර්ග අංශයට අදාලව කර තිබුණු නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------

### 2.1 වියදම් කළමනාකරණය

----------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබාගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා හේතුවෙන් මූලික වියදම් ඇස්තමේන්තු හා සංශෝධන වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 25 සිට සියයට 1750 දක්වා වූ පරාසයක පැවතුණි | මූලික වියදම් ඇස්තමේන්තු හා සංයෝජිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවයට, කොවිඩ් 19 වසංගත තත්ත්වය, බලාපොරොත්තු වූ පරිදි වියදම් ජනිත නොවීම , අනපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදුවීම, අමාත්‍ය නිල නිවාස වැඩි කාලයක් වසා තිබීම, අමාත්‍යාංශ නාම පුවරු වෙනස් කර සවිකිරීමට බලාපොරොත්තු නොවූ වියදමක් දැරීමට සිදු වීම, ඉල්ලුම් කරන ලද ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන අනුමත වී තිබීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි අනුමත නොවීම වැනි හේතු 17 ක් බලපා ඇත. | නිතිපතා සංශෝධනයන්ට ලක් නොවන සේ වර්ෂයේ වියදම් ඇස්තමේන්තු නිසි පුරෝකථනයකින් යුක්තව සැකසිය යුතුවේ. |
| (ආ) එකතු වටිනාකම රු.මිලියන 29.63 ක ශුද්ධ ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 17 කට අදාලව නිසි පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් සියයට 25 සිට සියයට 72 දක්වා පරාසයක විහිදුනු එකතු වටිනාකම රු.මිලියන 14.43 ක ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | වැය විෂයන් 17 කට අදාලව 25%-72% දක්වා ඉතිරිවීම් සිදුවීමට, කොවිඩ් 19 වසංගත තත්ත්වය, අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම, අමාත්‍ය නිල නිවාස වැඩි කාලයක් වසා තිබීම, අතුරු ගෙවීම් සහතික ගිණුම්ගත නොවීම, ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම, සහ අනුමත ප්‍රතිපාදන වැඩි වීම වැනි හේතු බලපා ඇත. | නිසි පුරෝකථනයකින් යුක්තව වැය ඇස්තමේන්තු සැකසිය යුතුවේ. |
| (ඇ) අමාත්‍යාංශය විසින් අයවැය ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 20 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 51,575.99 ක ප්‍රතිපාදන තුලින් එකී වැය විෂයය තුල වියදම් | මේ සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වය,බලාපොරොත්තු වූ වියදම් නොවීම, අමාත්‍ය නිල නිවාස වසා තිබීම, අළුත්වැඩියාවන් සිදු නොවීම, කොන්ත්‍රාත් හා උපදේශක සේවා බැංකු ණය මගින් ගෙවීමට තීරණය | නිවැරදිව හඳුනාගත් වියදම් අවශ්‍යතාවයන්ට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කල යුතුවේ. |

| | | |
|---|---|---|
| නොදරා සියයට 50 සිට සියයට 100 දක්වා වූ රු.මිලියන 45,388.06 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66/69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | කිරීම නිසා ප්‍රතිපාදන අවශ්‍ය නොවීම, ඉල්ලුම් කරන ලද ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන අනුමත වී තිබීම, සහ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතු බලපා ඇත. | |
| (ඈ) වැය විෂයයන් 17 කට අදාලව මුදල් රෙගුලාසි 66/69 මාරුකිරීම් යටතේ සලසාගෙන තිබූ රු.මිලියන 22,838.64 ක එකතු වටිනාකමකින් යුත් අතිරේක ප්‍රතිපාදන වලින් රු.මිලියන 19,296.68 ක් උපයෝජනය නොකිරීම හේතුවෙන් සියයට 50 සිට සියයට 100 දක්වා වූ ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | අපේක්ෂිත බිල්පත් නියමිත වෙලාවට ගෙවීමට ඉදිරිපත් නොවීම, අපේක්ෂිත පරිදි වියදම් ජනිත නොවීම, ගෙවීම් කරනලද IPC ගිණුම් ගත නොවීම, ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම සහ කෝවිඩ් -19 වසංගතය හේතුවෙන් වැඩ නිම කිරීම ප්‍රමාද වීම වැනි හේතු බලපා ඇත. | එම |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කොට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ බැරකම් හා බැඳීම්වල එකතුව රු.මිලියන 6,477 ක් විය. | භාණ්ඩාගාරයෙන් වාර්ෂික ලැබිය යුතු අක්මුදල් නිසි ප්‍රමාණයෙන්, නිසි කාලයට නොලැබීම නිසා නොපියවූ බැරකම් රු.මිලියන 6,477 ක් ඉතිරි වී ඇත. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 94 සහ 2017 අප්‍රේල් 21 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී නොසිටිය යුතු වුවද මුළු ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 91.5 ක් දක්වා බැරකම්වලට බැඳී තිබුණි. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි 94 සහ 2017 අප්‍රේල් 21 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.3** තැන්පතු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට බැර කිරීම හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වුවත් අමාත්‍යාංශයේ වර්ෂ 2 ත් 5 ත් අතර එකතු වටිනාකම රු.310,719 ක් වූ තැන්පතු ද වර්ෂ 5 ඉක්ම වූ රු.25,000 ක තැන්පතු ද 2020 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ව්‍යාපෘති අධ්‍යක්ෂගේ නිර්දේශ ලබාගෙන 2021 ජනවාරි මස රජයේ ආදායමට මාරු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාල පමාවකින් තොරව නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. |

**2.4** නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි - 760 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ ඌණතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හී අනාවරණය වූ ඌණතා හා අතිරික්තතා සම්බන්ධයෙන් අදාල අංශ ලිපි මගින් දැණුවත් කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුවේ. |
| (ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(ii) ඡේදය | අමාත්‍යාංශ මාරුවී ඇති විට වාහන නව අමාත්‍යාංශය නමට ලියාපදිංචි කර ගැනීමට කටයුතු කල යුතු වුවද අමාත්‍යාංශයේ වාහන 25 ක් සම්බන්ධව චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |

**2.5 අග්‍රිම ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශයේ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව, භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.53,516,251,279 ක් සහ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිමය රු.2,137,785,708 ක් වේ. ඒ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අග්‍රිම ලැබීම් රු.51,378,465,571 ක් විය යුතු වුවද, එය රු.53,516,251,279 ක් ලෙස දක්වා තිබුණි. | ඔබ පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිම මුදලින් භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම මුදල් අඩු කර, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අග්‍රිම ලැබීම් ලෙස වටිනාකම ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි. | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකම නිසිපරිදි සටහන් කල යුතුවේ. |
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය අවාසි රු.174,921,023,403 ක් විය යුතු වුවත් එය රු.2,141,059,758 ක් අඩුවෙන් රු.172,779,963,645 ක අවාසි ශේෂයක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් වටිනාකම භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම මුදල් අඩු කර නිරූපනය කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කල යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව මාර්ග නඩත්තු භාරකාර අරමුදල මඟින් ජාතික මහාමාර්ග කි.මී. 12,225 ක්, පාලම් 4,254 කට ආසන්න ප්‍රමාණයක් සහ ගුවන් පාලම් 12 ක නඩත්තු කටයුතුවලට අදාලව සියයට 100 ක භෞතික ඉලක්කයක් ළඟා කර ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුල සිදුකර තිබුණේ පළාත් 7 ක් ආවරණය කරමින් කි.මී.307 ක් වැලි මිශ්‍රිත තාර ආලේප කිරීම පමණි. | 2020 වර්ෂයේදී කි.මී. 307 ක මාර්ග වලින් තෝරා ගත් කොටස්වල කාලීන නඩත්තු කිරීම යටතේ වැලි මිශ්‍ර තාර ආලේපනය, පලුදු වැසීම, පෙරමුසු ඇතිරීම සිදු කර ඇත. | වර්ෂය තුලදී නඩත්තු කිරීමට අපේක්ෂිත මාර්ග වර්ගීකරණය කර නිශ්චිතව හඳුනාගත යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව, රථ වාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 8 අතරින් පන්නිපිටිය ගුවන් පාලම් මංසන්ධියේ මාර්ග සංඥා පද්ධතිය වැඩිදියුණු කිරීම, පන්නිපිටිය පදික මාරුව සකස් කිරීම හා කැළණිය විශ්වවිද්‍යාලය අසල පදික මාරුව සකස් කිරීම පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | 2020 පළමු කාර්තුවේදී COVID - 19 වසංගත කාල පරිච්ඡේදයන් හේතුවෙන්, නිෂ්පාදන ප්‍රමාදයන් නිසා TLS උපාංග චීනයෙන් නොලැබීම නිසා ඉහත ව්‍යාපෘති සියල්ලම ප්‍රමාද විය. | ඉලක්කගත භෞතික ප්‍රගතිය ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුවේ. |
| (ඇ) නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන මාර්ග ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය තුළදී ඉඩම් කැබලි 347 ක් අත්පත් කරගැනීමටත් පවුල් 330 ක් නැවත පදිංචි කිරීමටත් සැලසුම් කර තිබුණද, ඉඩම් කැබලි 97 ක් පමණක් පවරා ගෙන තිබූ අතර කිසිදු පුද්ගලයෙකු නැවත පදිංචි කිරීමක් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතියට වැය කර තිබූ රු.මිලියන 75.95 න් රු.මිලියන 69.84 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා වැයවී තිබුණි. | 2020 වර්ෂය තුළ අපේක්ෂා කරන ලද භෞතික ප්‍රගතින් ලඟාකර ගැනීමට නොහැකි වීම කෙරෙහි රට පුරා පැවති වසංගත තත්ත්වය හේතු වී ඇත. | ඉලක්කගත භෞතික ප්‍රගතිය ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතු යුතුවේ. |
| (ඈ) ක්‍රියාකාරී සැලැස්ම අනුව මහාමාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ලඟා කර භෞතික ඉලක්කයන් තීරණය කර නොතිබූ බැවින් වැඩසටහනේ කාර්යසාධන මට්ටමක් මැනීමට නොහැකි වී තිබුණි. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත් කරුවන්ට ඉදිකිරීම් කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. | වර්ෂය තුළදී ලඟා කර ගත යුතු භෞතික ඉලක්කයන් නිශ්චිතව තීරණය කර යුතුවේ. |
| (ඉ) ජාතික මාර්ගයන්හි පිහිටි හානියට පත්/අබලන් පාලම් නැවත ඉදිකිරීම/ප්‍රතිනිර්මාණය වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළදී සවිබල ගැන්වීම් කටයුතු සිදුකරනු ලැබිය යුතු පාලම් 50 න් 19 ක පමණක් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබුණි. | ලැබූ ප්‍රතිපාදන අඩුවීම හා වසංගත තත්ත්වය නිසා ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය අඩුවීමට බලපෑ බව දන්වා සිටිමි. | ඉලක්කගත භෞතික ප්‍රගතිය ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුවේ. |

**3.2 විදේශ ආධාර ව්‍යාපෘති**

**3.2.1 දෙවන එකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූලික සැලැස්මට අනුව වැඩසටහන විසින් පැකේජ 53 ක් යටතේ උතුරු, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල ජාතික මාර්ග 27 ක කිලෝමීටර් 340 ක් සහ ග්‍රාමීය මාර්ග 1,405 ක කිලෝමීටර් 3,400 ක මාර්ග පුනරුත්ථාපන කටයුතු සිදුකිරීමට අපේක්ෂා කළද, 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග 27 ක කිලෝමීටර් 319.96 ක සහ ග්‍රාමීය මාර්ග 1,349 ක කිලෝමීටර් 3,313.16 ක පුනරුත්ථාපන කටයුතුවලට අදාල කොන්ත්‍රාත් පමණක් ප්‍රදානය කර තිබුණි. | එකග වෙමි. | වැඩසටහනේ මූලික සැලැස්මට අනුකූලව කටයුතු කිරීම සහ කාල සීමාව සමඟ ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතුවේ. |
| (ආ) ප්‍රදානය කරන ලද පුනරුත්ථාපන කටයුතු අතරින්, කිලෝමීටර් 25.05 ක සමස්ථ දිගකින් සමන්විත ග්‍රාමීය මාර්ග 13 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. තවද, දැනට පුනරුත්ථාපන කටයුතු සිදුකරමින් පවතින ඉතිරි මාර්ග අතරින්, 2020 දෙසැම්බර් 31 වන විට ජාතික මාර්ග කිලෝමීටර් 39.97 ක සහ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 731.62 ක කටයුතු පමණක් අවසන් කර තිබුණි. මේ අනුව, ප්‍රදානය කරන ලද ජාතික හා ග්‍රාමීය මාර්ගවල ප්‍රගතිය එම මාර්ගවල දිගින් සියයට 21.93 ක් පමණක් විය. | එකග වෙමි. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතුවේ. |
| (ඇ) උපයෝජනය නොකළ ණය මත සමාලෝචිත වර්ෂය තුළදී බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 243.48 ක් අනාර්ථික ලෙස ණය ප්‍රදාන නියෝජිතායතනයට ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත බැඳීම් ගාස්තු රු.මිලියන 449.51 ක් විය. | ගිවිසුමට අනුව ආසියානු සංවර්ධන බැංකුව විසින් අයකරගනු ලබයි. | අපේක්ෂිත මුළු ණය මුදලම සැලසුම්සහගතව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුවේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව, සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවෙකුම ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඉදිකිරීම් කටයුතුවල නිරත වීමට පෙර කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තාවකාලික ලියාපදිංචියක් ලබා ගත යුතුය. එසේ වුවද මෙම අවශ්‍යතාවයන් නොසලකා ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකු වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | ආසියානු බැංකු මාර්ගෝපදේශවල මෙම කොන්දේසි නොමැති අතර කොන්ත්‍රාත්කරුවන් විසින් වෙන් වෙන් වශයෙන් ඉදිකිරීම් හා කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී ඇත. | 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධි විධාන ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානය කල යුතුවේ. |
| (ඉ) වැඩසටහනේ නිශ්චිත කොන්ත්‍රාත් කොන්දේසි අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයේ අවම වටිනාකම පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 1.5 ක් විය යුතු නමුත්, සමලෝචිත වර්ෂය තුළ අවම සීමාවට වඩා අඩු වටිනාකමින් යුත් අතුරු ගෙවීම් සහතික 259 ක් ඇගයීමට ලක් කර තිබුණි. | කොවිඩ් 19 වසංගතය, අයහපත් කාලගුණය, අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතා හේතුවෙන් නියමිත කාර්යය සාධනය ළඟා නොවුනු අතර සේවාදායකයා විසින් කොන්ත්‍රාත්තුකරුවන්ගේ මුදල් ප්‍රවාහය පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු සහතික ගෙවීමේ දී අවම වටිනාකම කොන්ත්‍රාත්තු වටිනාකමින් 1.5% වඩා අඩු අගයක් දක්වා ගෙවීම් කිරීමට එකඟ වී ඇත. | කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිවැය, කාලය සහ අනවශ්‍ය වාසි අවම කිරීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසි වල ඇති සීමාවන් පිළිපැදිය යුතුවේ. |
| (ඊ) කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන ඇපකර ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කාර්ය සාධන ඇපකර ලබා ගැනීම කොන්ත්‍රාත්තුවේ වැඩ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ලෙස ඇතුලත් කර ඒ සඳහා රු.මිලියන 85.64 ක් ගෙවා තිබුණි. | බස්නාහිර, නැගෙනහිර සහ උතුරු පළාත් වල කොන්ත්‍රාත්තු පැකේජයන්හි ප්‍රමාණ පත්‍ර වල කාර්යය සාධන ඇපකර සඳහා ගෙවීම යන වැඩ අයිතමය ඉවත් කර ඇත. | වැඩසටහන සඳහා සිදුවී ඇති අලාභය අය කරවා ගැනීමට කටයුතු කල යුතුවේ. |
| (උ) ගෙවීම් අයිතමයන් වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීම හේතුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ වැඩ ප්‍රමාණ පත්‍ර අතර ගාස්තු විෂමතා හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ දෙකකට අදාලව 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියට රු. මිලියන 48.2 ක අලාභයක් සිදුවී තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මෙම වෙනස තරහකාරී ඒකක (රේට) වෙනස් කල හැකි සීමාව ඉක්මවා නොමැති බවත් සමාලෝචනය කිරීමට හෝ අඩු කිරීමට කටයුතු කළ නොහැකි වේ. | වැඩසටහන සඳහා සිදුවී ඇති අලාභය අය කරවා ගැනීමට කටයුතු කල යුතුවේ. |
| (ඌ)කොන්ත්‍රාත් කොන්දේසි අනුව සියලු රසායනාගාර, ගෘහ භාණ්ඩ හා මැනුම් උපකරණ ව්‍යාපෘතිය අවසානයේ කොන්ත්‍රාත්කරු වෙතම ආපසු භාර දුන්නද, ඒ සඳහා රු. මිලියන 609 ක් ගෙවා තිබු බැවින් කොන්ත්‍රාත්කරුවන්ට අමතර ප්‍රතිලාභයක් සලසා තිබුණි. | මෙම වත්කම්වල අවශේෂ වටිනාකම - කොන්ත්‍රාත් මුදලින් අඩු කරන අතර යල්පැනගිය හා පරිහරණයට ගත නොහැකි භාණ්ඩ මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගතහොත් ඒවා රැස්කර තබා ගැනීම මාර්ග සංවර්ධන අධිකාරියට ද ගැටළු සහගත වේ. | අහිතකර කොන්ත්‍රාත් කොන්දේසි සංශෝධනය කිරීමට කටයුතු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | නැගෙනහිර පළාතේ මාර්ග හයක් පුනරුත්ථාපනය කිරීමට අලුතින් එකතු කර තිබෙන අතර ඒ සඳහා ව්‍යාපෘතිය මගින් ආසියානු සංවර්ධන බැංකුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයන් ලබාගෙන තිබේද යන්න හා එම කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සහ අනුමත කිරීමේ ක්‍රමවේදය විගණනය වෙත අනාවරණය කර නොතිබුණි. | නැගෙනහිර පළාතේ අළුතෙන් ඇතුලත් කරන ලද මාර්ග ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | විෂය පථය වෙනස් කළ යුත්තේ ණය දෙන ආයතනයේ සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයෙන් පසුව විය යුතුවේ. |
| (ඒ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, කොන්ත්‍රාත් පැකේජ ප්‍රදානය කළ වහාම කොන්ත්‍රාත්කරුවන් විසින් සිවිල් වැඩ ආරම්භ කළ යුතු වුවද, පැකේජ 37 ක සිවිල් වැඩ ආරම්භ කිරීම කොන්ත්‍රාත් ප්‍රදානය කළ දින සිට දින 30 ත්, දින 203 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණ අතර එවැනි ප්‍රමාදයකට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් වැඩසටහන අනුව කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවල කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුව කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ වහාම සිවිල් වැඩ ආරම්භ කිරීමට පියවර ගත යුතුවේ. |
| (ඔ) | ව්‍යාපෘතියේ පහසුකම් පරිපාලන අත්පොතට සහ 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වගන්තියට අනුව, ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සහ පළාත් සම්බන්ධීකරණ කමිටු අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. කෙසේ වුවත්, මෙම කමිටු දෙකම ඊට අනුගතව ප්‍රශස්ත ගණපූරණයකින් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් හා සම්බන්ධිකරණ කමිටු සෑම පළාතකම ක්‍රියාත්මක වන අතර නියමිත පරිදි රැස්වීම් පවත්වන අතර 2020 මාර්තු මස සිට කොවිඩ් වසංගතය හේතුවෙන් රැස්වීම් පැවැත්වීමට බාධා සිදුව ඇත. | සියළුම මෙහෙයුම් කමිටු ප්‍රශස්ත ගණපූරණයකින් පැවැත්විය යුතුවේ. |
| (ඕ) | 1987 අංක 3 දරණ රාජ්‍ය කොන්ත්රාත් පනතට අනුව රු.මිලියන 5 ඉක්මවන රජයේ කොන්ත්‍රාත්තු සඳහා පනත ප්‍රකාරව ලියාපදිංචි විය යුතු නමුත් අදාළ ලංසුකරුවන්ගේ තාක්ෂණික ලංසු ඇගයීමේදී ව්‍යාපෘතිය එම අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන නොතිබුණි. | 1987 අංක 03 දරන රාජ්‍ය කොන්ත්‍රාත් පතනට අනුව ලියාපදිංචි වී ඇත්දැයි සලකා බැලූ අතර ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ අනුව මෙය නුසුදුසු කමක් ලෙස සලකා නොමැත. | ලංසුකරුවන් සහ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව රාජ්‍ය කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලියාපදිංචි කළ යුතුවේ. |
| (ක) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (අ) (i) වගන්තියට අනුව, ලංසු සුරක්‍ෂණයේ වටිනාකම ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 1 සිට 2 දක්වා විය යුතු වුවද, ලංසුකරුවන් විසින් සපයන ලද ලංසු සුරක්‍ෂණ වටිනාකම මාර්ගෝපදේශයේ ඉහත අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. තවද, මාර්ගෝපදේශයේ 7.8.4 (ආ) උප | ලංසු සුරක්ෂිතයේ වටිනාකම ඇස්තමේන්තු වටිනාකමින් 1%හි සිට 2% දක්වා වන අතර නිශ්චිත ලංසු ආරක්ෂණ මුදලක් ලබාදෙන ලෙස කොන්ත්‍රත්තුකරුවන්ට දන්වා ඇත. සියළුම ලංසු කරුවන් ලංසු ගොනුවේ ප්‍රකාරව ආරක්ෂණ සපයා දී ඇත. ආරක්ෂණයේ කාලය හෝ මිලෙහි වෙනසක් වී නම් දින 7ක් ඇතුලත නැවත ඉදිරිපත් කිරීමට කාලය ලබාදී | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ලංසුකරුවන්ගෙන් ප්‍රමාණවත් ලංසු සුරැකුම් ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| වගන්තියට අනුව, ප්‍රමාණවත් ලංසු ආරක්ෂණ ඉදිරිපත් නොකිරීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට බලපාන මූලික අපගමනයක් වන අතර එම නිසා ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාවය විගණනයේදී ගැටළු සහගත වී තිබුණි. | ඇත. | |
| (ග) 2020 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ පුරප්පාඩු 70 ක් පැවති අතර එම පුරප්පාඩු ප්‍රධාන වශයෙන් ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු, සම්බන්ධීකරණ ඉංජිනේරු, ව්‍යාපෘති ඉංජිනේරු, ව්‍යාපෘති ගණකාධිකාරී වැනි අත්‍යාවශ්‍ය තනතුරු වලින් සමන්විත බැවින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපාන තත්ත්වයක පැවතුණි. | දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේම දිගුවක් වන අතර මෙම ව්‍යාපෘති දෙකටම එකම වැය විෂයක් යටතේ ප්‍රතිපාදන සලසා දී ඇත. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ප්‍රසම්පාදන, ඉංජිනේරුමය, මූල්‍යමය, පරිපාලන රාජකාරී වල නියැලෙන නිලධාරීන් විසින්ම දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේද රාජකාරී කරනු ලබන අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට බාධා ඇති වී නොමැත. | කාර්යසාධනය උපරිම කිරීම සඳහා වැඩසටහනේ සේවක පුරප්පාඩු අවශ්‍ය පරිදි සපුරා ගත යුතුය. |

**3.2.2 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | -------------------------- | --------------- |
| (අ) වැඩසටහන මඟින් දකුණ, මධ්‍යම, සබරගමු, වයඹ, උතුරු මැද පළාත්වල සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කි.මී. 218.19 කින් යුත් ජාතික මාර්ග සහ කි.මී. 3,106.10 කින් යුත් ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කටයුතු කිරීමට අපේක්ෂිත වුවද 2020 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග කි.මී. 104.13 ක පමණක් කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ දුර්වල කාර්යසාධනයක් තිබූ කොන්ත්‍රාත් පැකේජ 12 ක කොන්ත්‍රාත් ගිවිසුම අවසාන කරන ලද අතර 2020 වර්ෂයේ දී ඉන් පැකේජ 5ක් සඳහා කොන්ත්‍රාත්තු පිරිනමා ඇත. | වැඩසටහනේ මූලික සැලැස්මට අනුකූලව කටයුතු කිරීම සහ කාල සීමාව සමඟ ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතුවේ. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට දකුණ, සබරගමුව, මධ්‍යම, උතුරු මැද සහ වයඹ පළාත්වල සහ බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කි.මී. 2,203.87 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩ අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි. තවද 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළ කි.මී. 1,000.43 කින් යුත් ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කටයුතු අතහැර දමා තිබුණි. | දුර්වල කාර්යය සාධනයක් දිගින් දිගටම පවත්වාගෙන යන කොන්ත්‍රාත් පැකේජ 12 න් අවසන් කිරීමට තීරණය කරන ලදි. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතුවේ. |

| | | |
|---|---|---|
| (ඇ) අතහැර දමා තිබූ කොන්ත්‍රාත් පැකේජ 12 අතරින් කොන්ත්‍රාත් පැකේජ 05 ක ඉතිරි වැඩ මෙම ව්‍යාපෘති හරහා ඉටු කිරිමට සමාලෝචිත වර්ෂය තුළදි නැවත ප්‍රදානය කර තිබූ අතර මුලික කොන්ත්‍රාත් මිල සමග සන්සන්දනය කිරිමේදි නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල වටිනාකම රු. මිලියන 5,007 කින් වැඩි වී තිබුණි. මෙම දූර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් රජයට අතිරේක පිරිවැයක් දැරිමට සිදු වී තිබුණි. | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කොන්ත්‍රාත්කරුගේ දූර්වල ව්‍යාපෘති කළමනාකරණය හා ඒ ඒ ප්‍රදේශවල මාර්ග ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම නිසා ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ගණන් විශාල වශයෙන් ඉහළ යාමයි. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු අතර දූර්වල ව්‍යාපෘති මෙහෙයුම් ඒකක සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඈ) අතහැර දමා තිබූ කොන්ත්‍රාත් 04 හි ඉතිරි වැඩ කි.මි. 100,000 ග්‍රාමිය මාර්ග සංවර්ධනය කිරිමේ වැඩසටහන මගින් සම්පූර්ණ කිරිම සඳහා සමාලෝචිත වර්ෂය තුළදි එකඟතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර මුලික කොන්ත්‍රාත් මිල සමග සන්සන්දනය කිරිමේදි එම කොන්ත්‍රාත් වල වටිනාකම රු. මිලියන 580.14 කින් වැඩි වී තිබුණි. ඒ අනුව වෙනත් ව්‍යාපෘතියක් මගින් එම කොන්ත්‍රාත්තුව අදාල කොන්ත්‍රාත්කරුටම කරගෙන යාම සඳහා අවස්ථාව සලසා දිම මගින් අසාර්ථක කොන්ත්‍රාත්කරු වෙත අනිසි මුල්‍යමය ප්‍රතිලාභයක් ලබා දි තිබුණි. | පවතින මිල උච්චාවචනය ද සැලකිල්ලට ගෙන ඇති අතර මෙම කටයුතු වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු හට පැවරීමේ දී මීට වඩා අධික මිල ගණන් ඉදිරිපත් විය හැක. ප්‍රසම්පාදන ක්‍රියාවලියටද විශාල කාලයක් ගතවන බැවින් මෙම කොන්ත්‍රාත්තුකරුටම ලබාදීම තුල අනිසි මුදල් ප්‍රතිලාභයක් ලබාදිමක් සිදුවි නොමැත. | තව දුරටත් ප්‍රමාදයකින් හා අමතර පිරිවැයකින් තොරව ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගත යුතු අතර දූර්වල ව්‍යාපෘති මෙහෙයුම් ඒකක සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඉ) අතහැර දමා තිබූ කොන්ත්‍රාත් පැකේජ 12 අතරින් කොන්ත්‍රාත් පැකේජ 03 ක් 2019 වර්ෂයේදි අවසන් කර තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දක්වාම ඉතිරි වැඩ කරගෙන යාම සඳහා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. | එක් පැකේජයක් පමණක් ඉදිරියට වැඩ කරගෙන යන ලෙස අවස්ථා ගණනාවකදීම කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී ඇති අතර මේ පිළිබඳව ඉදිරියේ දී ක්‍රියා මාර්ගයක් ගැනීමට නියමිතව ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු වීම. |
| (ඊ) වැඩසටහන විසින් අතහැර දැමු කොන්ත්‍රාත් පැකේජ 12 ට අදාළ රු. මිලියන 2,668.47 ක වටිනාකමකින් යුතු කාර්යසාධන බැඳුම්කර අයකර ගැනිම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවර ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් විසින් එය නවතාලන ලෙස උසාවි නියෝග ලබාගෙන ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (උ)උපයෝජනය නොකළ ණය මත සමාලෝචිත වර්ෂය තුළදී බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 290.81 ක් අනාර්ථික ලෙස ණය ප්‍රදාන නියෝජිතායතනයට ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 1,471.26 ක් ගෙවා තිබුණි. | ගිවිසුම ප්‍රකාරව බැඳීම් ගාස්තු අයකරන අතර ණය මුදල එක වර උපයෝජනය කර ගැනීමට හැකියාවක් නැත. ණය ගිවිසුම් අවසාන කිරීමට එකඟ වී ඇති කාල වකවානුවට පෙරද ණය ගිවිසුම් අවසාන කර ඇත. | ව්‍යාපෘතියේ මූලික සැලසුම්වලට අනුව, අපේක්ෂිත කාර්යයන් උපරිම ආකාරයෙන් ඉටුකරගැනීම සහ අදාල නිකුත් කිරීමට අපේක්ෂිත මුළු ණය මුදලම උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) නවතා දමන ලද කොන්ත්‍රාත් පැකේජ 08 කට අදාළ ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. මිලියන 1,830 ක් අය කර ගැනිමට ව්‍යාපෘතිය අසමත් වී තිබුණි. ඒ අනුව අතහැර දැමූ පැකේජ 04 ද ඇතුළත්ව පැකේජ 12 කට අදාළ 2020 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් මුළු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 2,793 ක් විය. | කොන්ත්‍රාත්කරුවන් විසින් අධිකරන නියෝග ලබාගෙන ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (එ) 2019 වර්ෂයේ දි වයඹ පළාතේ අතහැර දැමූ කොන්ත්‍රාත් පැකේජ 05 ට අදාළ හදිසි වැඩ සම්පූර්ණ කිරිම සඳහා සහ මාර්ග ගමන් කල හැකි තත්ත්වයට පත් කිරිම වෙනුවෙන් වෙනත් ක්‍රියාකාරී කොන්ත්‍රාත් පැකේජ 02 ක් මඟින් රු.මිලියන 158.2 ක පිරිවැයක් 2020 දෙසැම්බර් 31 දින වන විට දරා තිබුණි. | ක්‍රියාකාරී කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත පවරා හදිසි වැඩ සම්පූර්ණ කර ගන්නා ලද අතර එසේ කරන ලද ගෙවීම් එම ආයතන දෙක සඳහා වූ ගෙවීම් සහතික තුල ඇතුලත් වේ. | අමතරව දැරූ වියදම් අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |

### 3.2.3 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - පොදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ කිලෝමීටර 46 ස්ථානයෙන් පසු අධිවේගී මාර්ග භාවිතා කරන්නන් සඳහා කිසිදු සේවා සැපයුම් ප්‍රදේශයක් නොමැති බැවින් වැළිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 176 ක් ගමන් කරන මගී ජනතාවට සේවා සැපයුම් සැලසීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි. | බැංකුව දැනුවත් කරන ලදී. නමුත් දෙවන සේවා ප්‍රදේශය සඳහා අරමුදල් සැපයීම චීන EXIM බැංකුව ප්‍රතික්ෂේප කර ඇත. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශයන් සකස්කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ 3 සහ 4 අදියරයන්හි, අධිවේගී මාර්ගයේ ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය කිලෝමීටරයකට මීටර් 1.5 - 2.3 ක පරාසයක පැවතිය යුතු අතර තාක්ෂණික පරීක්ෂණ අනුව එම දර්ශකයන් ලඟාකරගෙන තිබුණ ද, අධිවේගී මාර්ගයේ සමහර කොටස්වල මාර්ගයේ සුමටතාවය ධාවනය වන මෝටර් රථවල යහපත් ධාවන තත්ත්වය පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් වී නොතිබුණි. | පිරිවිතරයට අනුව අධිවේගී මාර්ගයේ IRI මිනුම් පිළිගැනීම පිළිබඳ ගැටළුවක් නොමැත. | තාක්ෂණික පිරිවිතර සැකසීමේදී මාර්ගවල ධාවනය වන වාහනවල ධාවන තත්ත්වය සහතිකවීමට අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතුය. |

**3.2.4 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-01**

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෝෂ දැනුම්දීමේ කාලය සහ ණය කාලය 2020 නොවැම්බර් 08 දිනෙන් අවසන් වුවද, ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අන්තර් හුවමාරුවක් ඉදිකිරීමේ ස්ථානයක් ලෙස හඳුනා නොගත් කපුදුව ප්‍රදේශයේ අර්ධ අන්තර් හුවමාරුවක් රු. මිලියන 459.8 ක පිරිවැයකට ඉදිකිරීමට 2020 නොවැම්බර් 10 දිනැති තීරණ මත පදනම්ව ආරම්භ කර තිබුණි. සැලසුම් අදියරේදී මෙම හුවමාරුව හඳුනාගෙන තිබුණේ නම්, මේ සඳහා වන පිරිවැය අවම කර ගත හැකිව තිබුණි. | මෙම අන්තර් හුවමාරුව සැලසුම් අදියරේදී හදුනා නොගෙන පසුව ඉදිකිරීම මගින් අමතර පිරිවැයක් දැරීමට සිදු නොවිය. | ඉදිරි ව්‍යාපෘති සැලසුම්කරනයේදී සියළු අවශ්‍යතා සළකා බැලිය යුතුය. |
| (ආ) දෝෂ වගකීම් කාලයෙන් පසුව වුවද නව අන්තර් හුවමාරුව ඉදිකිරීමේ විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දක්වා උපදේශන සේවා සඳහා රු.මිලියන 21.38 ක සහ ව්‍යාපෘති කළමනාකරණය සඳහා රු.මිලියන 17.05 ක අමතර පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. මෙම ඉදිකිරීම සඳහා අයවැය ප්‍රතිපාදන හෝ කිසිදු මූල්‍ය සැලැසුමක් 2021 වර්ෂය සඳහා සිදුකර නොතිබුණි. | එකඟ වේ. | අපේක්ෂිත කාලය තුල ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) කොන්ත්‍රාත් ලියකියවිලිවල සහ කොන්ත්‍රාත්කරුට සපයන ඉංජිනේරු උපදෙස්වල අපැහැදිලි අර්ථ දැක්වීම් නිසා ජම්බාර (Piling) සහ ජම්බාර නොවන ව්‍යුහාත්මක කටයුතු සඳහා භාවිතා කරන කොන්ක්‍රීට් පන්තිය පිළිබඳ පිරිවිතරයන් වෙනස් වීම හේතුවෙන්, ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව එය පිරිවැය ඉහලයාමක් සහ ගෙවීම් ප්‍රමාදයක් හෝ අතපසු කිරීම වෙනුවෙන් වූ පොලී මුදලක් ලෙස කොන්ත්‍රාත්කරුට රු.මිලියන 129.11 ක අතිරේක ගෙවීමක් කිරීමට සිදුවී තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමෙහි අඩංගු කොන්දේසි අංක 20.2 යටතේ පිහිටුවන ලද ආරවුල් විනිශ්චය මණ්ඩලය මගින් දෙන ලද තීරණය හා කොන්ත්‍රාත් කොන්දේසි අංක 20.5 යටතේ ඇති සාමකාමී බේරුම්කරණය ක්‍රමවේදය යටතේ මෙම ගෙවීම සිදු කරන ලදී. | ව්‍යාපෘතිය කළමනාකරණය සහ අධීක්ෂණය මනා ලෙස විය යුතුය. |
| (ඈ) පහසුකම් සපයන ගොඩනැගිලි රු.මිලියන 185 ක පිරිවැයක් යටතේ ස්ථිර පදනමින් ඉදිකර තිබුණද, එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තීරණය කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත උපයෝජනය පිළිබඳ නිසි සැලැස්මක් විගණන දිනය වූ 2021 පෙබරවාරි 05 දින වන විටත් සකස්කර නොතිබුණි. | මෙම ගොඩනැගිලි අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘතියේ කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේදී ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තිබිය යුතුය. |
| (ඉ) ව්‍යාපෘතියේ දෝෂ දැනුම් දීමේ කාලය 2020 නොවැම්බර් 08 දිනෙන් අවසන් වුවද, ව්‍යාපෘතිය සඳහා නිදහස් තීරුබදු යටතේ ආනයනය කරන ලද උපකරණ, යන්ත්‍රෝපකරණ, වාහන, ද්‍රව්‍ය, උපාංග සහ භාවිතයට නොගත් විගණිත දිනය වූ 2021 පෙබරවාරි 03 දින දක්වා ඉන්වොයිසි 447 ක් යටතේ ආනයනය කර තිබූ එ.ජ. ඩොලර් 35,868,363 ක් වූ නැවත අපනයනය කළ යුතු භාණ්ඩ නැවත අපනයනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | ඉන්වොයිසි 5 කට අදාල භාණ්ඩ නැවත අපනයනය කර ඇත. ඉතිරි ඉන්වොයිසි වල අඩංගු භාණ්ඩ නියමිත බදු ගෙවා දේශීය වශයෙන් අපහරණය කිරීමට කොන්ත්‍රාත් ආයතනය මගින් අනුමැතිය ඉල්ලා ඇත. ඊට අදාල ඉල්ලුම්පත්‍ර දැනටමත් මුදල් අමාත්‍යාංශයේ පිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | නැවත අපනයනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2.5 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-02**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිවේගී මාර්ගය සාමාන්‍ය ජනතාවට විවෘත කරන අවස්ථාවේදී, ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අන්තර් හුවමාරුවක් ඉදිකරනු ලබන ස්ථානයක් ලෙස හඳුනා නොගත් බැදිගම ප්‍රදේශයේ තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 100.83 ක් දරා තිබුණි. | නව බැදිගම අන්තර්හුවමාරුව ඉදිකිරීම සඳහා වැඩි කාලයක් ගතවනු ඇති බැවින්, මාර්ග භාවිතා කරන්නන්ට සේවය සැපයීම සඳහා බැදිගම හි තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකිරීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ අනුමැතිය ලබා ගන්නා ලදී . | ඉදිරි ව්‍යාපෘති සැලසුම්කරනයේදී සියළු අවශ්‍යතා සළකා බැලිය යුතුය. |
| (ආ) | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ තෙවන අදියර මඟින් ආනයනය කර තිබූ හා ව්‍යාපෘති අවසානයේ අපනයනය කළයුතු එ.ජ.ඩො. 10,363,385 ක් වටිනා උපකරණ නැවත අපනයනය කිරීමෙන් හෝ බදු ගෙවීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් රඳවා තබාගැනීමෙන් කොන්ත්‍රාත්කරුට අසාමාන්‍යය වාසි හිමි වී තිබුණි. | දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-අදියර 03 සඳහා ආනයනය කරන ලද උපකරණ හා යන්ත්‍රෝපකරණ දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-අදියර 02 සඳහා භාවිතයට ගැනීමෙන් දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-අදියර 02 හි නැතිවූ ප්‍රගතිය නැවත ලගා කර ගැනීමට කොන්ත්‍රාත්කරුට හැකි විය. | නැවත අපනයනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට හෝ අදාල බදු ගෙවීමට කටයුතු කළ යුතුය. |

**3.2.6 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර-03**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යසාධන සහතිකය ලැබෙන තෙක් කොන්ත්‍රාත්කරු විසින් ඉතිරිව ඇති කුණු කසළ, සුන්බුන් සහ තාවකාලික වැඩ කටයුතුවල අපද්‍රව්‍ය වැඩබිමෙන් ඉවත් කළ යුතු වුවද වලවේ ගඟ හරහා සිදුකළ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් භාවිතා කරන ලද තාවකාලික පාලම සඳහා භාවිතා කර තිබුණු යකඩ පටි සහ බාල්ක ඉවත්කර නොතිබුණ බැවින් මෙම තත්ත්වය ගඟේ ජලය ගලාබැසීම අවහිර කිරීමට හේතු වී තිබුණි. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී වලවේ ගඟ හරහා ඉදි කර තිබූ තාවකාලික පාලම තබා ගන්නා ලෙස මහජනතාව ඉල්ලා සිටියහ. | ගඟේ ජලය ගලාබැසීමට අවහිර නොවන සේ සුන්බුන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2.7 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -අදියර-04

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 106 ක වටිනාකමකින් යුත් ගොඩනැගිලි ස්ථිර පදනමක් මත ඉදිකර තිබුණද, ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල උපයෝජනය පිළිබඳ මූලික සැලැස්මක් සකස් කර නොතිබුණි. පසුව, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2019 ඔක්තෝබර් 19 දින එම පරිශ්‍රය මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතා වර්ධන මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර තිබුණද, විගණිත දිනය වූ 2021 ජනවාරි 08 දින වන විටද අධ්‍යක්ෂ මණ්ඩලය එය අනුමත කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ අවශ්‍යතා සඳහා ගොඩනැගිලි යොදාගෙන ඇත. ඉතිරි ගොඩනැගිලි මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට වෙන්කර ඇති අතර එය අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | ව්‍යාපෘතියේ කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේදී ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තිබිය යුතුය. |
| (ආ) ව්‍යාපෘතියේ රු. මිලියන 509 ක්වූ ආරවුල් හිමිකම්පෑම් තුනක් බේරුම්කරණය සඳහා තවමත් විවෘතව පැවතුණු අතර ව්‍යාපෘතියේ අඩුපාඩු නිවැරදි කිරීමට බැඳී සිටීමේ කාලය අවසන් වී මාස 06 ක් ඉකුත්වී තිබියදීත් කොන්ත්‍රාත්කරුගේ හිමිකම්පෑම අවසන් කළ නොහැකි වී තිබුණි. | ආරවුල් හිමිකම් පෑම් තුනෙන් දෙකක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් අතෘප්තිය පිළිබඳ දැනුම් දීම් සිදු කර ඇත්තේ මීට වසරකට පමණ පෙරය. එක් ආරවුල් හිමිකම් පෑමක් වෙනුවෙන් අතෘප්තිය දැනුම්දීම සිදු කර ඇත්තේ 2020 ඔක්තෝම්බර් 13 වන දිනය. | අතෘප්තිය පිළිබඳ දැනුම් දීමක් නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් විශේෂිත කොන්දේසි වලට ඇතුලත් කළ යුතුය. |
| (ඇ) විචලතා නියෝගයක් යටතේ මත්තල සහ මාගම්පුර අන්තර් හුවමාරු ස්ථානවල ගාස්තු අයකිරීමේ දොරටු සඳහා අමතර පාලම් තරාදි දෙකක් ඉදිකිරීම සඳහා රු.1,873,300 ක් වැය කර තිබුණ ද ඒවා ඉදිකර මාස 10 ක් පමණ ගතවී ඇතත්, විගණිත දිනය වූ 2021 ජනවාරි 06 දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | මත්තල හා මාගම්පුර අන්තර් හුවමාරු ස්ථානවල පාලම් තරාදි දෙකක් ඉදිකරන ලද්දේ ගුවන්තොටුපල හා වරාය ආසන්නයේ ඇති බැවින් වැඩි බර පැටවූ වාහන පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය පැනනැගුණු බැවිනි. | සියළුම ඉදිකිරීම් උපයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) බස් හා දුම්රිය සංක්‍රමණ පර්යන්තයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 3,000 ක් වෙන් කර තිබුණද එම පර්යන්තය ඉදිකිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. අදාල යෝජනාව අවලංගු කර තිබුණු අතර ව්‍යාපෘතියේ වෙනත් කාර්යයක් සඳහා එම ඉතිරිකිරීම් භාවිතා කිරීමේ අරමුණින් සංශෝධිත වැඩ ප්‍රමාණ පත්‍රයක ඇතුළත් කර තිබුණි. | මෙම දුම්රිය හා බස් පර්යන්තය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් එකඟතාවය ලබාදී නොතිබූ බැවින් එය ක්‍රියාත්මක නොවූ අතර එම මුදල් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමකින් තොරව ව්‍යාපෘතිය අවසානයේ ඉතිරි විය. | ප්‍රමාණ පත්‍ර නිසි ඇගයීමකට ලක් කළ යුතුය. |

### 3.2.8 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය -අදියර-03

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ සිට මේ දක්වා සිවිල් වැඩ කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 833.83 ක් වැය කර තිබුණි. | මධ්‍යම අධිවේගී මාර්ගයේ I කොටස සඳහා රු.මිලියන 222 ක් ද II කොටස සඳහා රු.මිලියන 51 ක් ද III කොටස සඳහා රු.මිලියන 560 ක් ද වශයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා ගෙවා ඇත. | ඉදිකිරීම කඩිනම කිරීමට සෑම පියවරක් ම ගත යුතුය. |

### 3.2.9 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය -අදියර-04

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ සිට මේ දක්වා අරමුදල් සැපයුම් නියෝජිතායතනයක් නොමැතිව සිවිල් වැඩ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමකින් තොරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙනුවෙන් රු. මිලියන 352.72 ක් වැය කර තිබුණි. | වැටුප් හා වේතන සඳහා රු.මිලියන 252.8 ක් ද රථවාහන නඩත්තු සඳහා රු.මිලියන 52.1 ක් ද ඉඩම් අත්පත් කරගැනීම සඳහා රු.මිලියන 9.4 ක්ද ගොඩනැගිලි කුලී හා නඩත්තු සඳහා රු.මිලියන 10.73 ක් ද සහ විදුලිය, ජලය, දුරකථන වැනි උපයෝගී වියදම් වෙනුවෙන් රු.මිලියන27.7 ක් ද ගෙවා ඇත. | ඉදිකිරීම කඩිනම් කිරීමට සෑම පියවරක් ම ගත යුතුය. |

### 3.2.10 පිටත වටරවුම අධිවේගී මාර්ග ව්‍යාපෘති අදියර III

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැඩ ප්‍රමාණපත්‍රවල අඩංගු රු.මිලියන 2,506 ක් වටිනා අයිතම් 64 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර රු. මිලියන 3,721ක් වටිනා තවත් අයිතම් 11 ක් සියයට 50 වඩා අඩුවෙන් සිදුකර තිබුණි. එසේම | මෙම වෙනස්කම් සඳහා විවිධ හේතු බලපා ඇත. | මුළු පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී සියලුම පිරිවැයන් සැලකිල්ලට ගෙන හැකිතාක් නිවැරදිව කල යුතුය. |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු කර තිබූ තවත් අයිතම් කීපයකම සත්‍ය පිරිවැය සියයට 51 සිට 2,353 ක් අතර පරාසයකින් වෙනස් වී තිබුණි. | | |
| (ආ) අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සියයට 85 ක් නිමකර තිබියදී 2019 නොවැම්බර් 09 දින හදිසියේම මාර්ගය ජනතාව සඳහා විවෘත කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2019 දෙසැම්බර් 03 දින අවසන් වී තිබීම නිසා ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් කටයුතු නිමකිරීමට නොහැකිවීම හා ඉදිකිරීම් සමාගමට ගෙවීමට ඇති රු. මිලියන 965 පමණ වූ මුදල නිරවුල් කිරීමට නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි. | ශේෂ වැඩ පිළිබඳ උපදේශකවරුන්ගේ ඇස්තමේන්තුවට අනුව, 2019 නොවැම්බර් 30 වන විට භෞතික ප්‍රගතිය සියයට 95.6 කි. | ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ණය ගිවිසුම් කාලය තුල ඉදිකිරීම් කටයුතු නිම කරවා ගැනීමට සෑම පියවරක්ම ගත යුතුය. |

### 3.2.11 අධිවේගී වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම ව්‍යාපෘතිය 2016 ආරම්භ කර තිබූ අතර ණය ගිවිසුම 2019 ජනවාරි 17 දින ගිවිසගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිත වුවත්, ව්‍යාපෘතිය ආරම්භයේදී ප්‍රධාන කාර්යයන් කීපයක්ම වසරකට අධික කාලයකින් ප්‍රමාද වී තිබුණි. මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ණය ගිවිසුමට එළඹීමෙන් මාස 08 කට පසුව එනම් 2019 අගෝස්තු 30 දින සිදුකර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රගතිය සියයට 53 ක් වුවත් සියයට 23 ක් පමණක් අත්කරගෙන තිබුණි. එමෙන්ම රු. මිලියන 10,382 න් ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් 08ක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි. මේ නිසා විදේශ ණය සඳහා 2020 වර්ෂය වෙනුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදන රු. මිලියන 5,858 න් සියයට 73 ක් භාවිතා කිරීමට නොහැකිව තිබුණි. | 2016 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කරන ලද ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම (ටීපීපීඑෆ්) නම් වූ ඒඩීබී තාක්ෂණික ආධාර ණය යටතේ, සැලසුම් සහ ලංසු ලේඛන සකස් කිරීම සහ ව්‍යාපෘතියේ ලංසු තැබීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී.<br>ඉදිකිරීම් ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වයයි. | ප්‍රමාද වූ ඉදිකිරීමේ කොන්ත්‍රාත් කඩිනම් කර අපේක්ෂිත ප්‍රගතිය ළඟාකර ගැනීමට කටයුතු කල යුතු අතර වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන් උපයෝජනය කළ හැකි වන පරිදි සැලසුම් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2.12 දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම ව්‍යාපෘතියේ පැකේජ් 2 යටතේ රු. මිලියන 3,064 ක පිරිවැයට ආරම්භ කර තිබූ මාර්ග ඉදිකිරීම් කටයුතු එම ඉදිකිරීම් ආරම්භ කිරීමෙන් පසුව රු. මිලියන 1,573 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 51 ක විචලන නියෝග පසුව හඳුන්වා දෙමින් මුල් ඉදිකිරීම් කටයුතු වෙනස් කර තිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තිය අනුව ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ පැකේජ් 2 යටතේ විචලන නියෝග හරහා වැඩිවන ලද පිරිවැයට අවශ්‍යය අනුමැතීන් ලබාගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබාගත යුතුය. |

**3.2.13 පාදෙණිය අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 නොවැම්බර් 30 දින ඉදිකිරීම් අවසන් වී තිබූ ව්‍යාපෘතියේ ඇවර කිරීමේ ගිණුම් 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ අතර ඉඩම් අත්පත් කරගැනීම් වෙනුවෙන් තවදුරටත් දැරිය යුතු රු.මිලියන 9.6 ක වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම ඇවර කිරීමේ ගිණුම් තුළ දක්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා පිළියෙළ කරන අවස්ථාව වන විට ඊට අදාළ ඉඩම් වන්දි හා පොලී ගෙවීමට තිබේදැයි ප්‍රාදේශීය කාර්යාල වලින් විමසා සිටියත්, අදාළ නිශ්චිත මුදලක් සොයාගැනීමට නොහැකි වූ නිසා 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන වල තවදුරටත් දැරිය යුතු වියදම් තිබේදැයි පෙන්වීමට නොහැකි විය. | ඉඩම් අත්පත් කරගැනීම් වෙනුවෙන් තවදුරටත් දැරිය යුතු වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම ඇවර කිරීමේ ගිණුම් තුළ සටහන් කළ යුතුය. |

**3.2.14 ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා වැලැක්වීමේ ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රසම්පාදනය කරන ලද වාහන, මෙහෙයුම් කාර්යාලය | ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී අවසන් වන අතර දැනටමත් ඒ සඳහා අවසාන ගිණුම් විගණනය සඳහා | අදාල ජංගම නොවන වත්කම් වෙනම ගිණුම් ගත කළ යුතුය. |

| | | |
| --- | --- | --- |
| ලෙස ඉදිකරන ලද ගොඩනැගිලි, සහ පරිගණක උපකරණ, කාර්යාලීය උපකරණ, විද්‍යුත් උපකරණ හා මෙහෙයුම් උපකරණ වටිනාකම වූ රු. මිලියන 369.6 ක් සිවිල් වැඩවල පිරිවැය තුලම ඇතුළත් කර තිබුණු අතර එය ප්‍රධාන කෙරීගෙන වැඩ වලින් වෙන් කර හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පිළියෙල කරමින් පවතී. එහිදී එම වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) ව්‍යාපෘතිය විසින් නඩත්තු ඒකකයක් ක්‍රියාත්මක කිරීම සඳහා මිලදී ගෙන තිබුණු වටිනාකම රු. මිලියන 23.08 ක් වූ නඩත්තු උපකරණ එම ඒකකය මේ දක්වා ආරම්භ නොකිරීම නිසා තැන් තැන්වල ගබඩා කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය මඟින් බදුල්ල 2nd Mile Post හි ස්ථාපනය කරන ලද නායයෑම් කළමනාකරණ ඒකකය මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ (ඌව) හා විධායක ඉංජිනේරු බදුල්ල වෙත ක්‍රමවත්ව අදාල උපකරණ භාර දෙන ලදී. | නඩත්තු උපකරණ අදාල කාර්යයන් සඳහා භාවිතයට ගත යුතුය. |

## 3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික මහාමාර්ග හා අධිවේගී මාර්ග ජාලයට ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් මාර්ග කි.මී.100,000 ක විකල්ප මාර්ග හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කල ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂයේදී මාර්ග කි.මී. 15,000 ක් සංවර්ධනය කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් ඒ අතුරින් මාර්ග කි.මී.1,070 ක් ආවරණය කරමින් මාර්ග 852 ක් පමණක් සංවර්ධනය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ කාර්යසාධනය සියයට 7.1 ක පමණ පහල මට්ටමක පැවතුණි. | අමු ද්‍රව්‍ය හිඟකම, යන්ත්‍ර සූත්‍රවල හිඟකම, මුදල් ගෙවීමේ ප්‍රමාදයන්, කොරෝනා උවදුර හේතුවෙන් ඇති වූ හේතුවෙන් 2020 වසර අවසන් වන විට කි.මී 1070 ක් පමණ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති අතර කි.මී. 4,518 ක පමණ වැඩ ක්‍රියාත්මක වෙමින් පවතිනි. | ඉදිකිරීමේ කොන්ත්‍රාත් කඩිනම් කර අපේක්ෂිත ප්‍රගතිය ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 04 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම යන මැයෙන් නිකුත් කළ අයවැය චක්‍රලේඛ අංක 07/2019 අනුව වියදම් ඒකක වලට ලබාදී තිබූ සම්පත් නිකරුනේ තැබීමෙන් වන පිරිවැය වැළැක්වීම් සඳහා සෑම පියවරක්ම ගත යුතු බව සඳහන් වුවද, අමාත්‍යාංශය සතුව පැවති වාහනවලින් භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින වාහන 11 ක් වසර කිහිපයක් තිස්සේ භාවිතයෙන් තොරව අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | අමාත්‍යාංශය සතු වාහන 06ක් අපහරණය සඳහා හඳුනාගෙන තිබූ බැවින් එම වාහන ධාවනය සඳහා යොදාගෙන නොමැත. ඉන් එක් වාහනයක් 2021-01-10 දින අපහරණය කිරීම සඳහා කටයුතු කර ඇත. අනෙක් වාහන ද අපහරණය කිරීම සඳහා කටයුතු සිදු කළ නමුත්, අලුතින් වාහන දීර්ඝ කාලයකට ආනයනය කිරීම සිදු නොකරන බැවින් ඉදිරි අවශ්‍යතා සඳහා එම වාහන අලුත්වැඩියා කර භාවිත කිරීම සඳහා පසුව තීරණය කර ඇත. ඒ අනුව, එම වාහන අලුත්වැඩියා කර ඵලදායීව භාවිත කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ඉල්ලා ඇත. | දේපල පිරියත උපකරණ සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට ක්‍රියා කල යුතුය. |
| (ආ) අමාත්‍යාංශය සතු KQ - 0690 දරණ රු.මිලියන 16 ක වටිනාකමින් යුත් රථය 2020 නොවැම්බර් 18 දින සිට මහනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත ලබාදී තිබුණි. | වාහනය ධාවන තත්ත්වයට ගැනීම සඳහා කළ යුතු වූ සැලකිය යුතු ප්‍රමාණයේ විශාල අලුත්වැඩියාවන් සඳහා අමාත්‍යාංශය සතු ප්‍රතිපාදන සීමා සහිත වූ බැවින් වාහනය නිකරුණේ ගාල් කර තැබීම නුසුදුසු වන බැවින් අලුත්වැඩියා කර භාවිත කිරීම සඳහා අදාළ සමාගම වෙත ලබා දී ඇත. | එම |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුලදී රු.3,379,991 වටිනාකමින් යුත් කාර්යාලීය උපකරණ අයිතම 102 ක් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණද එම වත්කම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල තක්සේරු කමිටු පත්කර කමිටු නිර්දේශය අනුව රු.2,515,881 ක් වටිනා කාර්යාල උපකරණ 2021.04.23 දින නිකුත් කිරීමේ නියෝගයෙන් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීම සිදුකරන ලදී. එහි ලැබීම් නියෝගය ලැබුණු පසු ඉදිරියේදී පොත් වලින් අඩු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | එම |

**3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 (i) සහ රජයේ නිළධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරය ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිළධාරීන් 02 නෙකු පමණක් ඇප තැන්පත් කර තිබුණි. | මු.රෙ 880 (1) සහ රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරය ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ නිලධාරින් දෙදෙනෙකු ඇප තැන්පත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ඉලක්ක සඳහා සූදානම් වීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික වැඩසටහනෙහි තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් ඇතුලත් කර නොතිබුණු නමුත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු 03 කට අදාලව පමණක් ඉලක්කයන් සහ දර්ශකයන් සඳහන් කර එම දර්ශකයන්ට අදාලව ප්‍රගතියක් නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී හදුනා ගන්නා ලද අරමුණු සහ ඊට අදාලව හදුනා ගනු ලැබූ ඉලක්ක හා දර්ශකයන් ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්ගේ භෞතික ප්‍රගතිය වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ නිශ්චිතව දක්වා ඇත. | වාර්ෂික වැඩසටහනෙහි තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් නිශ්චිතව ඇතුලත් කර ඒවා ළඟාකර ගැනීමට නිසි පරිදි ඇගයීමක් කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ද්විතියික මට්ටමේ තනතුරක් වන සංවර්ධන නිළධාරීන් 100 ක පුරප්පාඩු පැවතියද අමාත්‍යාංශයේ කාර්යභාරයට සෘජු සම්බන්ධතාවයක් නොමැති මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයන්හි රාජකාරී සඳහා අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද සංවර්ධන නිළධාරීන් 79 දෙනෙකු නිදහස් කර අමාත්‍යාංශය ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.43,813,443 ක් ගෙවීම් කර තිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරියට බඳවා ගන්නා ලද නිළධාරීන් 28 | රජයේ ප්‍රතිපත්තිමය තිරණයක් මත 2013 වර්ෂයේදී සංවර්ධන නිලධාරින් 365 දෙනෙකු මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති අතර ඒ සඳහා කාර්ය මණ්ඩල අනුමැතියද ලැබී ඇත.<br>මෙම සංඛ්‍යාව අඩු කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් වරින් වර සිදු කරන ලද ඉල්ලීම් මත, මේ වන විට එම සංඛ්‍යාව 220 දක්වා අඩු කර ගැනීමට හැකි වී ඇත. | අමාත්‍යාංශයේ සැබෑ සේවක අවශ්‍යතාවය නිරූපණය වන පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරගැනීම හා ඊට අදාල |

| | | |
|---|---|---|
| දෙනෙකු සහ ව්‍යාපෘතිවලින් නිළධාරීන් 02 කු සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. ඒ අනුව, සැලකීමේදී කාර්යමණ්ඩලය අනුමත කරගැනීමේදී සේවා අවශ්‍යතා පිළිබඳව නිසි ඇගයීමකින් හා සේවා අවශ්‍යතා නිර්දේශ ගැලපීමකින් තොරව සිදුකර තිබුණි. | | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |

**5.2 මානව සම්පත් සංවර්ධනය නිසිපරිදි සැලසුම් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන පුහුණු වැඩසටහන් 30 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර තිබුණත් එම සැලසුමේ සඳහන් වැඩසටහන් 03 ක් සඳහා කාර්යමණ්ඩලයේ නිළධාරීන් 196 දෙනෙකු අතරින් නිළධාරීන් 03 දෙනෙකු පමණක් සමාලෝචිත වර්ෂයේදී සහභාගී කර තිබුණි. | 2020 වර්ෂය තුලදී අනපේක්ෂිතව මෙරට තුල පැතිරුනු කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් නිලධාරින් රැස් කිරීම, ගෙන්වීම, ආදි තත්වයන් සිදු කිරීමට නොහැකි වූ බැවින් එම වර්ෂයේ අපේක්ෂිත පුහුණු සැලැස්ම නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | වාර්ෂිකව පුහුණු සැලසුම සකස්කිරීමේදී එක් එක් පුහුණු වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත පිරිවැය, සහභාගී වන නිළධාරීන් ගණන, වැඩසටහන පවත්වනු ලබන කාලසීමාව පිළිබඳව නිවැරදිව සැලසුම් කර ගත යුතුය. |